ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ලංකා සංදේශය

සිංහල සංස්කරණය

2021 සැප්තැම්බර්
ISSN 2792-1379 | වෙළුම 1 | 2 වෙනි නිකුතුව
විද්‍යුත් තැපෑල : editor@lankacourier.com
වෙබ් අඩවිය : lankacourier.com and lankacourier.org



# සෞභාග්‍යය උදෙසා එකමුතුව වැඩකරමු

## උසස් අධ්‍යාපනයේ හෙට දවස

## නිවසේ සිට වැඩ කිරීම

ශ්‍රී ලංකාවේ පොදු සේවාවට එක්වූ නව සංකල්පය

ISSN 2792-1379
9 772792 137004


ජනපති දැක්ම



# ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට නව සංකල්පයක්

1970 දශකයේ අග භාගයේ නිවසේ සිට වැඩකිරීමේ ගෝලීය පුරුද්දක් ඇතිවූ අතර 2000 වර්ෂයේදී, පළමු විධිමත් ක්‍රමය හඳුන්වා දී ඇත. බොහෝ රටවල් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයටම මෙම ක්‍රමය යොදා ගෙන ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සතුව මෙලෙස නිවසේ සිට රාජකාරි කාර්යන් කිරීමට කිසිඳු ප්‍රතිපත්තියක් හෝ මාර්ගෝපදේශයක්, ස්ථාපිත කර නොතිබුණි. රට තුළ අගුළු දැමීමේ කාලය තුළ මෙවැනි ක්‍රම අනුගමනය කිරීමට මුළු ලෝකයම බල කෙරුණි.

පසුගිය වසරේ Covid -19 වසංගතය සමඟ 'නවසාමාන්‍ය' තත්වයට අනුව වැඩකිරීමට මුළු ලෝකයම බල කෙරුණි. සියලුම රටවල් සමබරතාවයක් ඇතිකර ගනිමින් සෞඛ්‍ය අවශ්‍යතා පවත්වා ගැනීම සහ අත්‍යවශ්‍ය සේවා සැපයීමට උත්සුක වූහ. Covid.-19 වසංගතයේ පළමු රැල්ල ශ්‍රී ලංකාවට බලපාන අවස්ථාවේ දී රටම සම්පූර්ණයෙන් අගුළු දැමීමේ කාල සීමාවක් ප්‍රකාශයට පත් කිරීමට රජය තීරණය කළේය. කෙසේ වෙතත්, අත්‍යවශ්‍ය සේවා සම්පූර්ණයෙන්ම සැපයිය යුතු වූ අතර රජයේ සේවාවන් අවම කාර්ය මණ්ඩලයක් සහිතව පවත්වා ගත යුතු විය. ස්ථාපිත මාර්ගෝපදේශක් හෝ ආමන්ත්‍රණය කිරීමට පූර්වාදර්ශ නොමැති, එවැනි තත්ත්වයක් යටතේ මෙය නිසැකවම අභියෝගයක් විය.



මෙම අවශ්‍යතාවය නිරීක්ෂණය කිරීම හා සැපයීම සඳහා රාජ්‍ය අංශයේ සැලකිල්ල යොමුවූ අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පළමු වැඩ කෙටුම්පත් කිරීමට අවශ්‍ය උපදෙස් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ලබාදෙන ලදී.

## උපදේශන ක්‍රියාවලිය

ප්‍රතිපත්තියක් සහ මාර්ගෝපදේශ සකස් කිරීම මීට පෙර රට විසින් අත්විඳ නොමැති අතර එය නැගී එන අරගලයක් විය. එම නිසා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය උපදේශාත්මක එකක් විය. ප්‍රාදේශීය පරිපාලනයේ සියලුම විශේෂඥයින් එකතු කිරීම මෙමගින් සිදුවිය. ශ්‍රී ලංකාවේ පරිපාලන සේවය (සිවිල් හා සමාන වෙනත් බොහෝ රටවල සේවා) නිලධාරීන් 50කට අධික සංඛ්‍යාවක් මෙයට දායක විය. උපායමාර්ගික, මෙහෙයුම් සඳහා රාජ්‍ය සේවයේ, මධ්‍යම ආණ්ඩුවේ සහ ප්‍රාදේශීය පරිපාලනයේ සේවය කළ අය මෙන්ම විශ්‍රාමික අය ද නියෝජනය විය. මෙම ප්‍රතිපත්තියේ අරමුණු දෙකක් තිබුණි. පළමුවැන්න රජයේ අත්‍යවශ්‍ය සේවා සාමාන්‍ය පරිදි ප්‍රමාදයකින් තොරව ලබා දීමයි. දෙවැන්න සහ වැදගත්ම දෙයනම් පුරවැසියන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමයි. එම කාලය තුළ රාජ්‍ය සේවකයින්ගේ වගකීම කිසිදු බාධාවකින් තොරව ඉටුකිරීමට ඔවුන්ගේ සමීපතමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම තීරණාත්මක විය.

ඒ අනුව නිවසේ සිට වැඩකිරීමට අවසර දෙනු ලබන අතර රැකියා ස්ථානයේ භෞතිකව සේවකයින් සිටීම අවශ්‍ය නොවේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ, සේවකයින්ගේ භෞතික පැවැත්ම සීමාකිරීමට බල කෙරෙන දුරස්ථ වැඩපද්ධතියක් සඳහා කිසිදු ක්‍රමයක් නොතිබුණි. ප්‍රමාදයකින් තොරව සේවා ලබාදීමේ අවශ්‍යතාවය නිසා, යෝජිත ගෙදරසිට වැඩකිරීම (WFH) සැලැස්ම ක්‍රියාත්මක විය.



## ආයතනය - විශේෂිත ප්‍රමිති

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාකාරීත්වය සාධක තුනක් මත පදනම්විය. ආයතනයට නිශ්චිත වූ ප්‍රමිති සකස් කිරීම පළමුවැන්න විය. නිවසේ සිට වැඩකිරීමට අවශ්‍ය කෙටුම්පත් සාදා ගැනීමට ආයතන මාර්ගෝපදේශ සාදා ගැනීමට සෑම ආයතනයක් තුළම ආයතන ප්‍රධානියාට අවස්ථාව ලබාදුණි. වැඩ සිදුවිය යුතු ආකාර පිළිබඳව හා අවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳව ඇය/ඔහු දැන සිටියේය. සාමාන්‍ය තත්ත්වයන් යටතේ රජයේ සේවකයින් පෙ.ව8.30 ප.ව4.15 දක්වා වැඩකිරීමට අවශ්‍යවේ. ආයතන ප්‍රධානීන්ගේ නම්‍යශීලීභාවය අනුව නවසාමාන්‍ය යටතේ අවශ්‍යතාවය මත වැඩ කරන වේලාවන් නිර්වචනය කිරීමට WFH මාර්ගෝපදේශ ලබා දී ඇත. දිවාකාලයට, නියමිත වැඩ රාත්‍රියේ කිරීමට මෙමගින් ඉඩ සැලසුණි. නියෝජිත අධිකාරී කණ්ඩායම මෙම මාර්ගෝපදේශ හරහා උපරිම වැඩ


2-



ලබා ගැනීමට අදහස් කරයි. කුඩා අතථ්‍ය කණ්ඩායම්වල සේවකයින් මත පදනම්ව පවරා ඇති කාර්යයන් කිරීමට සේවකයන්ව වැඩකිරීමට දිරිමත් කරයි.

## කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව සහතික කිරීම

කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව සහතික කිරීම නවසාමාන්‍යහි දෙවැන්නයි. මානව සම්පත් සීමාකිරීම ඔවුන්ගෙන් සේවා ලබා ගැනීමේ දී අභියෝගාත්මක විය. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICT) විසින් අතිරික්ත හා සම්පත් හිඟයන් පිළිබඳව අන්තර්ජාලය පදනම්කරගත් සම්පත් සංචිතයක් නිර්මාණය කර ඇත. බලයලත් ආයතනයක් පිහිටුවීමෙහි අරමුණ වන්නේ, සම්පත් හිඟයකට මුහුණ පා සිටින එක් ආයතනයක බෙදා හදා ගත හැකි අතිරේක සම්පත් ඇති වේදිකාවක් නිර්මාණය කිරීමයි. සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යවලට විරුද්ධව ප්‍රතිපත්තිය නිර්මාණය කළ අතර ඒවා ලිපි, ෆැක්ස් හා පෞද්ගලික හමුවීම්ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ රාජ්‍ය ආයතනවල ප්‍රායෝගිකව නොතිබූ විධිමත් සන්නිවේදන මාධ්‍ය එනම්, වට්ස්ඇප් සහ විශාලන වේදිකා

> ❝ ***මහජනතාව ඔවුන් මුහුණදුන් දුෂ්කරතා මාධ්‍යයේ වුවද රාජ්‍ය සේවකයින්ගේ සම්පූර්ණ වැටුප දිගටම ගෙවීමට කටයුතු කළ අතර WFH ප්‍රතිපත්ති තුළ මෙයට නිසි සැලකිල්ලෙන් ලබා දී ඇත.***

(zoom platform) නිල ආකෘති ලෙස පිළිගැනීමට ලක්විය. අදාළ නිලධාරීන්ගේ කාර්යාලීය දුරකථන හා ජංගම දුරකථන වෙත ඇමතුම් යොමු කිරීමේ පහසුකම් ස්ථාපිත කරන ලෙස ආයතනවලින් ඉල්ලා සිටියේය. මහජන ඉල්ලීම් සහ දුක්ගැනවිලි ප්‍රමාදයකින් තොරව බලාගැනීම සඳහා සෑම ආයතනයක්ම තම වෙබ් අඩවිවල විශේෂ වේදිකාවක් ඇතිකරවන ලෙසට ද උපදෙස් දෙන ලදී. WFH නව ප්‍රතිපත්තියේ කැපීපෙනෙන ලක්ෂණයක් නම්, නිවසේ සිට වැඩ කරන කාලය තුළදී ආයතනික ප්‍රතිනිර්මාණය පිළිබඳ සංකල්පයක් සංකල්පගත කරන ලෙස සියලුම ආයතනවලට දුන් නියෝගයයි. මෙහි අරමුණ වන්නේ, යල්පැන ගිය නිලධාරිවාදී රතු පටි සහ සේවා සැපයීම අහෝසි කර ආයතනික ව්‍යවස්ථාව හා ක්‍රියාකාරී පදනම සහ ප්‍රතිපත්තිරාමු මගින් වැඩ,සේවා සැපයීම පහසු කිරීමය.


ඵලදායිතාව, ප්‍රතිපත්ති පදනම් කරගත් මාර්ගෝපදේශ මත රඳා පවතින අතර වැඩකරන පරිසරයන්හි විවිධ දේවල්වල සියුම්කම් ග්‍රහණයකර ගැනීමට හැකිය. අතිරේකව පොදු මාර්ගෝපදේශ මාලාව මගින්, WFH හි ප්‍රාදේශීය පරිපාලනය, අධ්‍යාපනය, සුභසාධනය, පොදු ව්‍යාපාර වැනි අංශවලට නිශ්චිත මාර්ගෝපදේශන ද ලබා දුණි. කාර්යාල පදනම්කරගත් ක්ෂේත්‍ර වැඩ පූර්ණය කිරීමට ප්‍රාදේශීය පරිපාලනයේ හදිසි අවස්ථාවලදී මෙය ඉතා ප්‍රයෝජනවත් වේ. කෙසේ වෙතත් 'නව සාමාන්‍ය'යටතේ දැනට පවතින වැඩ විධිමත් ලෙසකිරීමට අවශ්‍යය. මෙය සපුරාලීම සඳහා මාර්ගෝපදේශ මගින් පදනම්ව නව WFH ප්‍රතිපත්තිය [illegible]නිකව වැඩ වාර්තා උපදෙස් පිළිබඳ සටහන් කරගැනීමට දින පොතක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත.

## පුරවැසි වගකීම

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මෙම සේවාව ප්‍රමුඛ කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර එය නව ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේ දී ස්ථාපිත පුරුදු මහජනයාගේ අවශ්‍යතා මත අනුගත විය යුතු බවත් පැවසීය. රාජ්‍ය සේවකයින් අතර උසස් පුරවැසි හැඟීමක් පවත්වා ගැනීම තුන්වන හා වැදගත්ම දෙයයි. මහජනතාව ඔවුන් මුහුණදුන් දුෂ්කරතා මාධ්‍යයේ වුවද රාජ්‍ය සේවකයින්ගේ සම්පූර්ණ වැටුප දිගටම ගෙවීමට කටයුතු කළ අතර WFH ප්‍රතිපත්ති තුළ මෙයට නිසි සැලකිල්ලෙන් ලබා දී ඇත. අගුළු දැමීමේ කාලය තුළ ඔවුන්ගේ පදිංචි ප්‍රදේශවල නිරෝධායන ක්‍රියාකාරකම් සමග කටයුතු කරමින් රාජ්‍ය සේවකයින්ගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා මාර්ගෝපදේශ කෙටුම්පත්කර ඇත. කලාපීය පරිපාලනය අගුලු දැමීම මහජනතාව මුහුණදුන් විශාල ම අභියෝගයයි. අත්‍යවශ්‍ය දේ බෙදාහැරීමේ ජාලය හා සෞඛ්‍ය නිර්දේශ පවත්වා ගැනීම එය මත රඳාපැවතුණි. රජයේ සේවකයන්ට ආයතන ප්‍රධානීන්ගේ නිසි අනුමැතියක් සහිතව කලාපීය වශයෙන් ඕනෑම ආයතනයක ස්වේච්ඡාවෙන් වැඩකිරීමට WFH මාර්ගෝපදේශ නිදහස ලබා දුණි. මෙය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය කිසිදා නොදුටු ලක්ෂණයක් වූ අතර විපත් කාලයේ රාජ්‍ය සේවකයින් උපරිම ධාරිතාවයෙන් තම කටයුතු ඉටුකිරීමට උත්සුක වූහ. නිවසේ සිට සියලුම සේවකයින්ට වැඩ කළ නොහැකි වූ අතර ඔවුන්ගේ රාජකාරි ස්වභාවය හා යටිතල පහසුකම් සැපයීමේ දුෂ්කරතාවය එයට හේතු වී ඇත. මේ සඳහා ද පිළියමක් හඳුන්වාදෙන ලදී. නිවසේ සිට වැඩකරන හෝ නොකරන සේවකයන්ට වැඩ පැවරීම හා කාර්ය සාදක බලකායන් පිහිටුවීමට අතිරේක මිනිස් බලය ලබා ගැනීම සම්බන්ධයෙන් WFH මාර්ගෝපදේශ මගින් ආයතන ප්‍රධානීන්ට බලය ලබා දී ඇත. රාජ්‍ය අංශයේ වැඩ බලකායෙන් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට මෙමගින් නව මාවතක් විවෘත විය.

Covid- 19 යනු, කිසිවෙකුට සම්පූර්ණයක් අවබෝධකර ගැනීමට නොහැකි වූ නව තර්ජනයකි. නව ප්‍රතිපත්තිය විසින් සේවකයන්ගෙන් සේවය ලබා ගැනීමේ දී නිවෙස් පරිසරය පිළිබඳව සලකා බලන ලදී. WFH මාර්ගෝපදේශ සකස් කිරීමේදී සේවකයින්ගේ පවුල්වල

**"Covid- 19 යනු, කිසිවෙකුට සම්පූර්ණයක් අවබෝධකර ගැනීමට නොහැකි වූ නව තර්ජනයකි. නව ප්‍රතිපත්තිය විසින් සේවකයන්ගෙන් සේවය ලබා ගැනීමේ දී නිවෙස් පරිසරය පිළිබඳව සලකා බලන ලදී.**



ළමා රැකවරණය සහ යැපෙන සත්කාර වගකීම් පිළිබඳව විශේෂයෙන් සොයා බලන ලදී. පවුල්වල ආරක්ෂාව තහවුරුකිරීම සඳහා සියලු පියවර ගන්නා ලෙස ජනාධිපතිවරයා ජනතාවගෙන් ඉල්ලා සිටියේය. ඔහු මෙම අගුලු දැමීමේ කාලය ස්වයංපෝෂිත භාවය ආරම්භ කිරීමේ පළමු පියවර ගැනීමට අවස්ථාවක් කරගන්නා ලදී. මෙම මාර්ගෝපදේශය මඟින් රජයේ සේවකයන්ට ඔවුන්ගේ පවුල් එනම්, වැඩිහිටියන් හා දරුවන් රැකබලා ගනිමින් නිවසේ සිට වැඩකිරීමට හා ගෙවතු වගාවන් සිදුකිරීමට දිරිමත් කරන ලදී. ඔවුන්ගේ අධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම සාහිත්‍ය කුසලතා ඇගයීමට මෙම අගුළු දැමීමේ කාලය මඟින් ඉඩ සැලසුණි.

## දේශීය රාජ්‍ය සේවයේ හැරවුම් ලක්ෂය

ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2020.03.30 දිනැති අංක PS/CSA/Circular/18/2020 චක්‍රලේඛනයෙන් පළමු WFH ප්‍රතිපත්තිය මාර්ගෝපදේශය නිකුත් කෙරුණු අතර පසුව නිකුත් කළ අතිරේක චක්‍රලේඛ මඟින් කාලයට ගැලපෙන පරිදි සේවකයන්ගෙන් කුඩා සංඛ්‍යායාවක් පමණක් නැවත සේවාස්ථානයට කැඳවන ලදී .

මෙහි මූලික ලක්ෂණයවූයේ, ක්‍රියාත්මත කළ හැකි ප්‍රතිපත්ති සියල්ල ඇතුළත් වීමයි. නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය මඟින් මෙතෙක් හිඟව තිබූ ප්‍රතිපත්තිය නිර්මාණය කරන ලදී. Covid-19 වැනි අනපේක්ෂිත විපතක දී රාජ්‍ය සේවකයන්ට ඔවුන්ගේ පවුල්වල වගකීම් නොසලකා හැරීමකින් තොරව ආරක්ෂිතව ආකාරයකින් ප්‍රජා වගකීම් ඉටුකිරීමට ද එමඟින් ඉඩසැලසුණි. ජනාධිපති ගෝඨාභය මහතා හඳුන්වාදුන් නිවසේ සිට වැඩ කිරීමේ පළමු පියවර ඉතිහාසයේ විශේෂී සලකුණක් ලෙස කැපී පෙනේ. උදාහරණයක්ලෙස, බිය උපදවන ගෝලීය අභියෝග ජය ලබා ගැනීමට ප්‍රායෝගික චින්තනය, කණ්ඩායම් වැඩ සහ කඩිනම්ක්‍රියා මාර්ග සංකලනය විය යුතුය.

ජීවන්ති සේනානායක [illegible].

*(ලංකා කුරියර් 2021 ජූලි කලාපයේ පළවූ Work From Home A Novel Concept in the Public Service of Sri Lanka ලිපියේ සිංහල අනුවාදනය )*

